**විෂය** - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**ශ්‍රේණිය** - 8

**මාසය** - දෙසැම්බර් **සතිය** - 01 **ක්‍රියාකාරකම් අංකය** - 45

**සැකසුම- එම්.එච්.ඩී.මධුමාලි ,ර/ඇඹි/ගගේයාය විද්‍යාලය ,ඇඹිලිපිටිය**

## 6 - අන්තර්ජාලයේ සැරිසරමු

## 6.2 වෙබ් පිටු නිර්මාණය - III (වෙබ් පිටුවකට ඡේද ඇතුලත් කිරීම සහ අක්ෂර වර්ණ ගැන්වීම)

### ශිෂ්‍ය කාර්යය -

- පහත දී ඇති සටහන හොඳින් කියවා අවබෝධ කරගන්න.

- HTML මෙවලම භාවිතයෙන් වෙබ් පිටු නිර්මාණයේදී ඡේද ඇතුලත් කිරීමට <P> උසුලනය යොදා ගනී.
  උදා - <P> අවශ්‍ය ඡේදය යතුරුලියනය කරන්න </P>
- ඡේදයක් , රූපයක්, වචනයක් වෙබ් පිටුවේ තිරස්ව මැදට ගැනීමට <center> උසුලනය යොදා ගනී.
  උදා - <center> අවශ්‍ය ඡේදය යතුරුලියනය කරන්න </center>
- වෙබ් පිටුවකට ඇතුලත් කරන අක්ෂර හැඩ ගැන්වීමට <font> උසුලනය යොදා ගනී.

| කාර්යය | HTML උසුලනය (ආරම්භක හා අවසන් කිරීමේ ) |
|---|---|
| අකුරු වර්ණ ගැන්වීම | <font color="වර්ණයේ නම">............</font> |
| අකුරු තද පැහැ ගැන්වීම | <b> තද පැහැ කළ යුතු වචනය හෝ වාක්‍ය </b> |
| අකුරු ඇල කිරීම | <i> ඇල කළ යුතු වචනය හෝ වාක්‍ය </i> |
| අකුරු යටින් ඉරක් ඇඳීම | <u> යටින් ඉරක් ඇඳිය යුතු වචනය හෝ වාක්‍ය </u> |

- <br/> උසුලනයෙහි ආරම්භක/අවසාන ලෙස උසුලන දෙකක් නැත.ඡේදයක් බිඳ පහළට ගැනීමට බිඳිය යුතු ස්ථානයට යොදයි.

- අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු/ ගුරුවරයෙකු ගෙන් විමසා අවබෝධ කරගන්න.
- පහතින් දක්වා ඇති මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබාගෙන ඉගෙනගන්න.
- ඔබ සතුව පරිගණකයක් තිබේනම් වැඩ පොතෙහි 6.3 ක්‍රියාකාරකමෙහි පිටු අංක 51, 52 සහ 53 ට අදාළ පියවර අනුගමනය කරන්න.
- ක්‍රියාකාරකම් සිදුකිරීමේදී ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාගන්න.

**මෙම පාඩමට අදාළව උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක -**

- e නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=10960
- වෙනත් -
    - Youtube- https://youtu.be/bv-Wgxco6Po
    - HTML පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත වෙබ් අඩවි - https://www.w3schools.com
      (Menu → HTML Reference මත ක්ලික් කරන්න → අවශ්‍ය html Tag එක මත ක්ලික් කරන්න. → it Yourself මත ක්ලික් කර වෙනස්කම් සිදු කර බලන්න.)
      http://www.tutorialspoint.com/html
    - සවියෙන් පෙරට - අපි එකට e- ඉගෙනුම් පාසල හොරණ අධ්‍යාපන කලාපය - https://drive.google.com/file/d/1k_FJOEo8NMtekAoSMZqZiFual1glMdW2/view?usp=sharing

**මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගෙනුම්ඵල -**

- වෙබ් පිටුවකට ඡේද ඇතුලත් කරන ආකාරය සහ අකුරු වර්ණ ගන්වන ආකාරය හඳුනා ගනියි.
- අක්ෂර <font> වලට අදාල ගුණාංග හඳුනා ගනියි.
- එදිනෙදා කාර්යයන් පහසුවෙන් ඉටුකර ගැනීමට තොරතුරු තාක්ෂණය යොදා ගනියි.
- හොඳින් කියවා සහ සවන් දී අවබෝධයෙන් යුතුව පිළිතුරු සපයයි.

- **ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය -**

1. වෙබ් පිටුවකට අක්ෂර ඇතුලත් කිරීමේදී අකුරු වලට අදාලව හඳුනා ගත් ගුණාංග කිහිපයක් (Attributes) නම් කරන්න .
2. අක්ෂර හැඩ ගැන්වීමට අදාලව පහත උසුලන වල ද ආරම්භක සහ අවසාන උසුලන අතරට වචන යොදා ස්වයං අධ්‍යයනයක යෙදෙන්න.

| HTML උසුලනය (ආරම්භක හා අවසන් කිරීමේ ) | අක්ෂර හැඩ ගැන්වීමේ ස්වාභාවය | උදාහරණය | දිස්වන ආකාරය |
|---|---|---|---|
| <sup> </sup> | උඩු ලකුණු කරන ලද | 06 <sup> th </sup> october | 06 $^{th}$ october |
| <sub> </sub> | යටි ලකුණු කරන ලද | CO <sub> 2 </sub> | $CO_2$ |
| <marquee> </marquee> | තිරස් දිශාවට චලනයක් පෙන්වන | <marquee> ඔබේ නම </marquee> | වෙබ් පිටුවකට යොදා බලන්න. |

3. e නැණපියස අන්තර් ක්‍රියාකාරී ක්‍රියාකාරකම සිදු කරන්න.
   https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=18639